# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 ඔක්තෝබර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු.12.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 7.75 යි.

# 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2005 ඔක්තෝබර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 8/2002.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1**. මේ පනත 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (1) යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්තේ, සිදු කරනුයේ හෝ සිදු කිරීමට ඉඩ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද (මෙහි මින්මතු "පීඩාවට පත් තැනැත්තා" යනුවෙන් හඳුන්වනු ලබන) ඒ තැනැත්තා විසින් ඒ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව වැළැක්වීම සඳහා ආරක්ෂා කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. පීඩාවට පත් තැනැත්තකු විසින් ඉල්ලීමක් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් –

(අ) පීඩාවට පත් තැනැත්තකු විසින් ;

(ආ) පීඩාවට පත් තැනැත්තා ළමයකු වන අවස්ථාවක, ඒ ළමයා වෙනුවෙන් –

(i) ළමයාගේ දෙමව්පියන්ගෙන් එක් අයකු විසින් හෝ ළමයාගේ භාරකරුවකු විසින් ;

(ii) ළමයා පදිංචිව සිටින ස්ථානයේ පදිංචි තැනැත්තකු විසින් ;

(iii) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ලිඛිතව බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ; හෝ

(ඇ) පීඩාවට පත් තැනැත්තකු වෙනුවෙන් පොලිස් නිලධරයකු විසින්,

ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිටපත් දෙකකින් යුක්තව මෙහි II වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර පීඩාවට පත් තැනැත්තා හෝ අදාළ තැනැත්තා

තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් පදිංචිව සිටින්නේ නැතහොත් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව සිදු කරනු ලැබ ඇත්තේ, සිදු කරනුයේ හෝ සිදු කිරීමට ඉඩ ඇත්තේ හෝ සිදුවූයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක, අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ අධිකරණය වෙත ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ඉහත සඳහන් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව දැනුමක් ඇති යම් තැනැත්තකුගේ දිවුරුම් ප්‍රකාශ ආධාරකයක් ලෙස ඉල්ලුම් පත්‍රයට අමුණනු ලැබිය හැකි ය.

ඉල්ලීම සලකා බැලීම.

**3**. මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විටක අධිකරණය විසින් වහාම ඒ ඉල්ලීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

අතුරු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය.

**4**. (1) ඉල්ලීම සහ දිවුරුම් ප්‍රකාශ ඇත්නම් එම දිවුරුම් ප්‍රකාශ සලකා බැලීමෙන් පසු අධිකරණය විසින් –

(අ) ඉල්ලීම පිළිබඳ විභාගය අවසන් වනතුරු (මෙහි මින් මතු "අතුරු ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අතුරු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම අවශ්‍ය බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන අධිකරණය විසින් වහාම අතුරු ආඥාවක් නිකුත් කළ යුතු අතර, එම ඉල්ලීමේ දින සිට දින දහහතරකට නොවැඩි දිනයක දී එම ඉල්ලීම පිළිබඳ විභාගයක් පැවැත්වීම සඳහා ආඥාවක් කළ යුතු ය ; හෝ

(ආ) අතුරු ආඥාවක් කිරීමට අවශ්‍ය නොවන බව අවස්ථානුගත කරුණු අනුව අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ඉල්ලීමේ දින සිට දින දහහතරකට නොවැඩි දිනයක දී එම ඉල්ලීම පිළිබඳ විභාගයක් පැවැත්වීම සඳහා ආඥාවක් කළ යුතු ය :

එසේ වුව ද, එවැනි අතුරු ආඥාවක් නිකුත් කිරීමට පෙර අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකුගෙන් දිවුරුම මත සාක්ෂි විභාග කළ යුතු ය.

(2) අතුරු ආඥාවක් නිකුත් කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවීම වැළැක්වීම සඳහා වූ හදිසි අවශ්‍යතාව සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතික කිරීමේ අවශ්‍යතාව අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් පසු, අධිකරණය විසින් වගඋත්තරකරු වෙත දැන්වීමක් නිකුත් කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, එම දැන්වීමේ සඳහන් දිනයක දී ඔහුට එරෙහිව ආරක්ෂක ආඥාවක් නිකුත් නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද අතුරු ආඥාව ද,(1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ කරනු ලබන ආඥාව ද (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීම සමග වගඋත්තරකරු වෙත භාර දිය යුතු අතර එම ලේඛන පිස්කල් මගින් හෝ වෙනත් බලයලත් නිලධරයකු මගින් භාරදීම තිසි උද්යෝගයෙන් ක්‍රියා කළ ද, කළ නොහැකි නම්, එම ලේඛන ඔහුගේ සාමාන්‍ය වාසස්ථානයෙහි ප්‍රකට ව පෙනෙන ස්ථානයක අලවනු ලැබුවහොත් එම ලේඛන වගඋත්තරකරු වෙත භාර දෙනු ලැබුවා වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අතුරු ආරක්ෂක ආඥාව.

**5**. (1) අතුරු ආඥාවක් –

(අ) මගින් ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම විභාග වෙමින් පවතින අවස්ථාවක වගඋත්තරකරු විසින් යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීමට කටයුතු සැලැස්වීම වළක්වනු ලැබිය යුතු ය ;

(ආ) යම් සිද්ධියක අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන සහ යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වැළැක්වීම සඳහා යම් තහනමක් හෝ කොන්දේසියක් අවශ්‍ය බවට අවස්ථාවෝචිත පරිදි පීඩාවට පත් තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් නැතහොත් වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකු විසින් දිවුරුම මත දෙන ලද සාක්ෂි මත අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඕ) දක්වා වූ අනු ඡේදවල සඳහන් වෙනත් යම් තහනමක් හෝ කොන්දේසියක් අන්තර්ගත විය හැකි ය.

(2) අතුරු ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක-

(අ) පාර්ශ්වයන්ගේ යහපත පිණිස වන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, පාර්ශ්වයන්ට උපදේශනය කරන ලෙස සමාජ සේවකයකුට හෝ පවුල් උපදේශකවරයකුට නියම කරනු ලැබිය හැකි අතර එම උපදේශන සැසිවාරවලට සහභාගි වන ලෙස අදාළ පාර්ශ්වයන්ට නියම කරනු ලැබිය හැකි ය.

(ආ) පීඩාවට පත් තැනැත්තා ආරක්ෂා කිරීම සහ එම තැනැත්තාට වහාම ආරක්ෂාව සැපයීම සාධාරණ ලෙස අවශ්‍ය වී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, ආඥාව ක්‍රියාත්මක වන්නේ ද යන්න නියාමනය කරන ලෙස සහ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර ඉල්ලීම විභාග කිරීම සඳහා නියමිත දිනයක දී අධිකරණය වෙත වාර්තාව ඉදිරිපත් කරන ලෙස සමාජ සේවකයකුට, පවුල් උපදේශකවරයකුට, පරිවාස නිලධරයකුට, පවුල් සෞඛ්‍ය සේවකයකුට හෝ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධරයකුට නියම කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණය විසින් ආරක්ෂක ආඥාවක් නිකුත් කරන තුරු හෝ අතුරු ආඥාව ඉවත් කරන තුරු එම අතුරු ආඥාව බලාත්මකව තිබිය යුතු ය.

වගඋත්තරකරු අධිකරණයට පැමිණෙන අවස්ථාවක ආරක්ෂක ආඥාව නිකුත් කිරීම.

**6**. (1) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, නිකුත් කරන ලද දැන්වීමක නිශ්චිතව දැක්වෙන දිනයක දී වගඋත්තරකරු අධිකරණයේ පෙනී සිටින අවස්ථාවක, අධිකරණය විසින් ඉල්ලීම පිළිබඳව විභාග කළ යුතු අතර, කලින් ලබාගත් යම් සාක්ෂියක් සමඟ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි නඩු වාර්තාවේ කොටසක් විය යුතු දිවුරුම් ප්‍රකාශ හෝ වාචික සාක්ෂි මාර්ගයෙන් වූ වැඩිදුර සාක්ෂි මත ඉල්ලීම පිළිබඳව ද සලකා බැලිය යුතු ය.

(2) වගඋත්තරකරු නෛතික නියෝජිතයකු මගින් පෙනී නොසිටින අවස්ථාවක දී, අධිකරණය විසින් සිය කැමැත්තෙන්ම හෝ පීඩාවට පත් තැනැත්තාගේ ඉල්ලීම මත,

(අ) ඒ පීඩාවට පත් තැනැත්තා ද ඇතුළුව සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාගය වගඋත්තරකරු විසින් නොකළ යුතු බවට ;

(ආ) ප්‍රශ්න වගඋත්තරකරු විසින් අධිකරණයට ප්‍රකාශ කිරීමට සහ එමගින් අධිකරණය විසින් ඒ ප්‍රශ්න නිවැරදිව පීඩාවට පත් තැනැත්තාගෙන් හෝ සාක්ෂිකරුගෙන් විමසීමට හැකිවීම සඳහා

ආඥා කළ හැකි ය.

(3) විභාගයෙන් පසු ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමට අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ දී වගඋත්තරකරු අධිකරණයට පැමිණ සහ ප්‍රචණ්ඩ ක්‍රියාව හෝ ක්‍රියා පිළි නොගන්නා නමුත් ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමට විරුද්ධ නොවන අවස්ථාවක, අධිකරණය විසින් 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කළ යුතු ය.

7. (1) 4 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව දැක්වෙන දිනයේ දී වගඋත්තරකරු අධිකරණයට නොපැමිණෙන අවස්ථාවක සහ වගඋත්තරකරු වෙත දැන්වීම භාර දී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් කලින් ලබාගත් සාක්ෂි සහ අධිකරණය විසින් විධාන කළ හැකි නඩු වර්තාවේ කොටසක් විය යුතු දිවුරුම් ප්‍රකාශවල හෝ වාචික සාක්ෂි මාර්ගයෙන් වූ වැඩිදුර සාක්ෂි මත ඉල්ලීම පිළිබඳව සලකා බැලිය යුතු ය. වගඋත්තරකරු අධිකරණයට නොපැමිණි විට ආරක්ෂක ආඥාව නිකුත් කිරීම.

(2) අධිකරණය විසින් එය ඉදිරියේ ඇති සාක්ෂි සලකා බැලීමෙන් පසුව ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම අවශ්‍ය බවට සෑහීමට පත්වන අවස්ථාවක, 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ආරක්ෂක ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

8. ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීම කළ යුතු ද හෝ නොකළ යුතු ද යන්න පිළිබඳව තීරණය කිරීමේ දී, යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවීම වැළැක්වීමේ අවශ්‍යතාව සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතිකවීමේ අවශ්‍යතාව අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය. ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු.

9. ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමේ දී – ආරක්ෂක ආඥාව වගඋත්තරකරු වෙත භාර දිය යුතු බව.

(අ) ඒ ආඥාව වගඋත්තරකරු වෙත භාරදීමට ; සහ

(ආ) ඒ ආඥාවේ සහතික පිටපත් –

(i) පීඩාවට පත් තැනැත්තා වෙත භාර දීමට ;

(ii) පීඩාවට පත් තැනැත්තා ඉල්ලුම්කරු නොවන අවස්ථාවක, ඉල්ලුම්කරු වෙත භාරදීමට ;

(iii) වගඋත්තරකරු සහ පීඩාවට පත් තැනැත්තා පදිංචිව සිටින්නේ යම් පොලිස් ස්ථානයක බල ප්‍රදේශය තුළ ද ඒ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත භාරදීමට,

අධිකරණය විසින් වහාම කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

10. (1) ආරක්ෂක ආඥාවක් – ආරක්ෂක ආඥාව.

(අ) මගින් යම් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුකිරීමෙන් හෝ සිදුකිරීමට සැලැස්වීමෙන් වගඋත්තරකරු වළක්වනු ලැබිය යුතු ය ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහ යහපත සහතිකවීම සඳහා එසේ කිරීම අවශ්‍ය බවට සිද්ධියේ අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන සහ අවස්ථාවෝචිත පරිදි, පීඩාවට පත් තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් වැදගත් සාක්ෂිකරුවකු විසින් දිවුරුම මත දෙන ලද සාක්ෂි මත අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඕ) දක්වා වූ අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තහනමක් හෝ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ පරිපූරක ආඥාවක් එහි අන්තර්ගතව තිබිය හැකි ය.

(2) ආරක්ෂක ආඥාවක් එම අඥාවෙහි සඳහන් කර ඇති පරිදි මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා බලාත්මකව තිබිය යුතු ය.

අතුරු ආඥාවක හෝ ආරක්ෂක ආඥාවක තිබිය හැකි තහනම් කිරීම්.

11. (1) අධිකරණය විසින්, අතුරු ආඥාවක් හෝ ආරක්ෂක ආඥාවක් මගින් වගඋත්තරකරු –

(අ) පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු හවුලේ වාසය කරන යම් වාසස්ථානයකට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ –

(i) වාසස්ථානයට,

(ii) සේවා ස්ථානයට,

(iii) පාසලට,

ඇතුළුවීම ;

(ඇ) පීඩාවට පත් තැනැත්තා තාවකාලිකව නැවතී සිටින යම් ස්ථානයකට ඇතුළුවීම ;

(ඈ) පීඩාවට පත් තැනැත්තා විසින් සාමාන්‍යයෙන් වාසය කරන හෝ වාසය කර ඇති හවුල් වාසස්ථානයකට හෝ එහි යම් කොටසකට ඇතුළුවීම හෝ එය තුළ රැඳී සිටීම වැළැක් වීම ;

(ඉ) හවුලේ වාසය කරන නිවසක පදිංචිව සිටීමෙන් ;

(ඊ) පීඩාවට පත් තැනැත්තාගේ යම් ළමයකු සමඟ සම්බන්ධතා පැවැත්වීම ඒ ළමයාගේ යහපත සඳහා බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන කොන්දේසි සපුරාදීමේ දී හැර පීඩාවට පත් තැනැත්තාගේ ළමයා සමඟ සම්බන්ධතා පැවැත්වීම ;

(උ) පීඩාවට පත් තැනැත්තා හවුලේ භුක්ති විඳින සම්පත් ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ ඒ සම්පත්වලට ප්‍රවේශවීම වැළැක්වීම;

(ඌ) කවර හෝ යම් ආකාරයකින් පීඩාවට පත් තැනැත්තා සමග සම්බන්ධ වන හෝ සම්බන්ධතාවක් ඇති කර ගැනීමට උත්සාහ කිරීම ;

(එ) පීඩාවට පත් තැනැත්තාට සහාය වන ඥාතිවරයකු, මිතුරකු සමාජ සේවකයකු හෝ වෛද්‍ය නිලධරයකු වන වෙනත් යම් තැනැත්තකුට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීමෙන් ;

(ඒ) හිරිහැරයක් සිදුවන පරිදි පීඩාවට පත් තැනැත්තා පසු පස ගමන් කිරීම ;

(ඔ) අධිකරණයේ මතය අනුව වගඋත්තරකරුගෙන් ආරක්ෂාව අවශ්‍ය වන පීඩාවට පත් තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ආරක්ෂාවට, සෞඛ්‍යයට හෝ යහපතට හානිදායක වන්නා වූ ද, අධිකරණය විසින් ආරක්ෂක ආඥාවේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි වූ ද වෙනත් ක්‍රියා කලාපයක නියැලීම ;

(ඕ) පීඩාවට පත් තැනැත්තා අසරණ තත්වයට පත් කරන පරිදි වෛවාහික නිවස විකිණීම, පැවරීම, අන්සතු කිරීම හෝ බරක් පැටවෙන ආකාරයට කටයුතු කිරීම,

තහනම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තහනමක් පැනවීමේ දී –

(අ) පීඩාවට පත් තැනැත්තාගේ හෝ පීඩාවට පත් තැනැත්තාගේ ළමයින්ගේ (සිටිනම්) සහ වගඋත්තරකරුට ළමයින් ඇත්නම් ඒ ළමයින්ගේ නැවතීමේ පහසුකම් සඳහා අවශ්‍යතාව ;

(ආ) ආඥාව කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වගඋත්තරකරුට හෝ වෙනත් යම් තැනැත්තකුට සිදුවිය හැකි යම් දුෂ්කරතාවයක්,

පිළිබඳව අධිකරණය සැලකිල්ලට ගත යුතු ය.

**12.** (1) ආරක්ෂක ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව, සෞඛ්‍ය හෝ සුභසාධනය ආරක්ෂා කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම සාධාරණ ලෙස අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක අධිකරණය විසින් – පරිපූරක ආඥාව.

(අ) වගඋත්තරකරුගේ සන්තකයේ තිබිය හැකි යම් ආයුධ පොලීසිය විසින් අත්අඩංගුවට ගත යුතු බවට ;

(ආ) පීඩාවට පත් තැනැත්තාගේ සහ ඔහුට ළමයින් ඇත්නම් එම ළමයින් ගේ පෞද්ගලික දේපළ එකතු කර ගැනීමට සහායවීම පිණිස පීඩාවට පත් තැනැත්තා සමඟ යම් ස්ථානයකට යා යුතු බවට පොලිසියට නියෝග කිරීමට ;

(ඇ) තිබිය හැකි පරිදි විධානාත්මක උපදේශන සැසිවාර මනෝවිද්‍යාත්මක සායන හෝ වෙනත් ආකාරයක පුනරුත්ථාපන ප්‍රතිකර්මවලට සහභාගිවන ලෙසට වගඋත්තරකරුට සහ පීඩාවට පත් තැනැත්තාට ;

(ඈ) පීඩාවට පත් තැනැත්තා ඉල්ලා සිටින්නේ නම් ඔහුට හෝ ඇයට තාවකාලිකව නවාතැන් පහසුකම් සැපයිය හැකි අතර, අවශ්‍ය වන්නේ නම් එසේ නැවතී සිටින ස්ථානයේ පිහිටීම සහ වෙනත් විස්තර රහසිගතව තබා ගත යුතු බවට ;

(ඉ) සමාජ සේවකයකු, පවුල් උපදේශකයකු, පරිවාස නිලධරයකු හෝ පවුල් සෞඛ්‍ය සේවකයකු විසින් පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු අතර ඇති ආරක්ෂක ආඥාවක් නිරීක්ෂණය කළ යුතු බවට සහ සෑම මාස තුනකටම වරක් ඊට අදාළ වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවට ;

(ඊ) යම් තැනැත්තකුට ආධාර කිරීම සඳහා වගඋත්තරකරුට කාර්ය භාරයක් ඇති අවස්ථාවක, වගඋත්තරකරු විසින් එම තැනැත්තාට හදිසි මුදල් ආධාර ලබා දිය යුතු බවට ;

(උ) 11 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් පීඩාවට පත් තැනැත්තා නැවතී සිටින ස්ථානයට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම වගඋත්තරකරුට තහනම් කරනු ලැබ ඇති වුව ද එය නොතකා, එම ආඥාව ක්‍රියාත්මක වන කාලය තුළ දී පීඩාවට පත් පාර්ශ්වය නැවතී සිටින යම් ස්ථානයක එම පාර්ශ්වයට දිගටම නැවතී සිටීමට හැකිවීම පිණිස අවශ්‍ය වන අවස්ථාවෝචිත පරිදි, ගෙවීම් කිරීම සහ පහසුකම් සැලසීම නැතහොත් ගෙවීම් කිරීම හෝ පහසුකම් සැලසීම වගඋත්තරකරු විසින් සිදු කළ යුතු බවට,

ආඥා කරනු ලැබිය හැකිය.

(2) නිසි පරීක්ෂණයකින් පසුව සහ පීඩාවට පත් තැනැත්තාගේ සහ වගඋත්තරකරුගේ මූල්‍ය අවශ්‍යතා සහ මූල්‍ය සම්පත් සැලකිල්ලට ගැනීමෙන් පසුව පමණක් (1) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේද යටතේ වූ ආඥාවක් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද එවැනි ආඥාවකින් 1999 අංක 37 දරන නඩත්තු පනත යටතේ යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ නියම කරන ලද යම් ගෙවීමක් සිදු කිරීමට වගඋත්තරකරු අපොහොසත් වීමේ දී අධිකරණය විසින් ගෙවීමට නියම කළ මුදල් හෝ එහි යම් කොටසක් පීඩාවට පත් තැනැත්තාට කෙළින්ම ගෙවන ලෙස අධිකරණය විසින් වගඋත්තරකරුගේ සේවායෝජකයකුට නියම කරනු ලැබිය හැකි ය.

පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව කරනු ලබන ආඥා.

**13**. අධිකරණය විසින්, නඩු කටයුතුවල පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව, වරදකරුවීම ඔප්පුවීමක් නොමැතිව හෝ වරදකරු බවට පිළිගැනීමක් නොමැතිව, මේ පනත යටතේ යම් ආඥාවක් කරනු ලැබිය හැකි අතර, එම ආඥාව, වරද පිළිගැනීමේ හෝ වරදකරු බවට ඔප්පුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලැබ ඇති ආඥාවක් ලෙස තේරුම් නොගත යුතු ය.

ආරක්ෂක ආඥාවක් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

**14**. පීඩාවට පත් තැනැත්තා හෝ වගඋත්තරකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත ආරක්ෂක ආඥාවක් වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම, විවර්තනය කිරීම, දීර්ඝ කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවශ්‍යවන අවස්ථානුගත කරුණුවල වෙනසක් සිදු වී ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, එම ආරක්ෂක ආඥාව වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම, විවර්තනය කිරීම, දීර්ඝ කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු යන දෙදෙනාටම සවන් දීමකින් තොරව එවැනි වෙනස් කිරීමක් සුළු වශයෙන් වෙනස් කිරීමක්, විවර්තනය කිරීමක්, දීර්ඝ කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත් එම ඉල්ලීම කරනු ලබන්නේ නිදහස් ලෙස සහ ස්වේච්ඡාවෙන් බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, අධිකරණය විසින් පීඩාවට පත් තැනැත්තාගේ ඒ ඉල්ලීමට අවසර නොදිය යුතු ය.

වගඋත්තරකරු සහ සාක්ෂි කරුවන් පැමිණ සිටීම.

**15**. වගඋත්තරකරු සහ සාක්ෂිදීම සඳහා ඉල්ලුම්කරු විසින් ඉල්ලීම කරනු ලබන යම් තැනැත්තකු ද පැමිණ සිටිය යුතු බවට සහ මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යම් ලේඛනයක් ඉදිරිපත් කළ යුතු බවට බල කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ V වන සහ VI වන පරිච්ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

කලත්‍රයා පිළිගත් සාක්ෂිකරුවකු වන බව.

**16**. මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී එක් කලත්‍රයකු, අනෙක් කලත්‍රයාට එරෙහිව පිළිගත් සාක්ෂිකරුවකු විය යුතු ය.

අභියාචන කිරීමේ අයිතිය.

**17**. 6 වන වගන්තිය හෝ 7 වන වගන්තිය හෝ යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම ආඥාව අපරාධ නඩුවක දී හෝ කරුණක දී මහෙස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද අවසාන ආඥාවක් වූවාක් මෙන් සලකා, ඒ හා සමාන ආකාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාත් බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තියේ සිට 330 වන වගන්තිය දක්වා වූ වගන්ති (ඒ වගන්ති දෙකම ඇතුළුව) සහ 357 වන සහ 358 වන වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ අභියාචනයට අදාළ වන්නේ ය :

එසේ වුව ද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 323 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 6 වන හෝ 7 වන වගන්තිය යටතේ වූ එම ආඥාව, වාර්තා කළයුතු මනා හේතූන් මත පළාත් බද මහාධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරනු ලබන්නේ නම් මිස, එම අභියාචනය ඉදිරිපත් කිරීමේ හේතුව නිසා නතර කරනු නොලැබිය යුතු ය :

එසේ ම තවදුරටත්, මහෙස්ත්‍රාත්වරයා විසින් පළාත් බද මහාධිකරණය වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමේ දී ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා තම ආඥාවේ පිටපතක් තමා වෙත රඳවාගත යුතු ය.

ආඥා ක්‍රියාවේ යෙදවීම.

**18**. අවස්ථාවෝචිත පරිදි අතුරු ආඥාවක් හෝ ආරක්ෂක ආඥාවක් යම් වගඋත්තරකරුවකුට එරෙහිව නිකුත් කරනු ලැබ, ඔහු ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, එම වගඋත්තරකරු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**19**. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අන්තර්ගතව කුමක් සඳහන් වුව ද, චෝදනා කෙටුම්පත් කිරීමේ දී අධිකරණය විසින්, යෝග්‍ය යයි සලකනු ලබන කාර්ය පටිපාටියක් අනුගමනය කළ යුතු ය.

චෝදනා කෙටුම්පත් කිරීමේ දී අධිකරණය විසින් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු බව.

**20**. (අ) මේ පනත යටතේ වූ, ඉල්ලීමක ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුගේ අනන්‍යතාවය දැනගත හැකි පරිදි එම ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුගේ නම හෝ වෙනත් කාරණයක් ; හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ නඩු තීන්දුවක් හැර, මේ පනත යටතේ යම් අධිකරණයක පවතින නීති කෘත්‍යයකට අදාළව යම් කාරණයක් මුද්‍රණය කරන හෝ ප්‍රකාශයට පත් කරන යම් තැනැත්තකුට,

අවුරුදු දෙකක් දක්වා වූ කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී යම් කාරණයක් මුද්‍රණය කරන හෝ ප්‍රකාශයට පත් කරන තැනැත්තන්ට දඬුවම් කළ යුතු බව.

**21**. පීඩාවට පත් තැනැත්තාට වෙනම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැවරීමට ඇති අයිතිවාසිකමක් අහිමි කරන ලෙස මේ පනතේ සඳහන් කිසිවක් තේරුම් නොගත යුතු ය.

වෙනත් නඩු පැවරීම වළක්වා නොමැති බව.

**22**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**23**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ –

අර්ථ නිරූපණය.

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු අදහස් වේ ;

"ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව" යන්නෙන්-

පීඩාවට පත් තැනැත්තා සහ අදාළ තැනැත්තා අතර ඇති පෞද්ගලික ස්වභාවයේ සම්බන්ධතාවයෙන් පැන නගින්නා වූ ද නිවසේ පරිසරය තුළ දී හෝ පිටත දී අදාළ තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ ඇති කරන ලද සහ,

(අ) I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති යම් වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක් ;

(ආ) යම් උද්වේගශීලී බැන වැදීමක්,

අදහස් වේ ;

"උද්වේගශීලී බැන වැදීම" යන්නෙන්, පීඩාවට පත් තැනැත්තකු කෙරෙහි යොමු කරන ලද බරපතල ස්වභාවයේ අවමන් කිරීමේ හෝ අපහාස කිරීමේ ක්‍රියා කලාපයක ස්වරූපයකින් යුක්ත වන්නා වූ ද, ඒ පීඩාවට පත් තැනැත්තාට බරපතල ක්ෂණික පීඩාවක් ඇති කිරීමේ බලපෑම ඇත්තා වූ ද ක්‍රියාවක් අදහස් වේ ;

"හවුලේ බුක්ති විඳින සම්පත්" යන්නෙන්, පීඩාවට පත් තැනැත්තා සහ වගඋත්තරකරු සිරිතක් වශයෙන් භාවිත කළ හෝ ඔවුන්ට ප්‍රවේශය තිබුන නිශ්චල හෝ චංචල දේපළ අදහස් වේ ;

පීඩාවට පත් තැනැත්තාට අදාළව "අදාළ තැනැත්තා" යන්නෙන් –

පිඩාවට පත් තැනැත්තාගේ –

(අ) (i) කලත්‍රයා ;

(ii) වෙන්වීමකට පෙර සිටි කලත්‍රයා ;

(iii) සහවාසයේ යෙදෙන සහකරු ;

(ආ) පීඩාවට පත් තැනැත්තකුගේ කලත්‍රයාගේ, කලින් සිටින කලත්‍රයාගේ හෝ සහවාසයේ යෙදෙන තැනැත්තාගේ-

(i) පියා, මව, සීයා, ආච්චි, බාප්පා, සුළුමව ;

(ii) පුතා, දුව, මුනුබුරා, මිනිබිරිය, සුළුපුතා, සුළු දියණිය ;

(iii) සහෝදරයා, සහෝදරිය, අර්ධ සහෝදරයා, අර්ධ සහෝදරිය, සුළු සහෝදරයා, සුළු සහෝදරිය ;

(iv) දෙමාපියන්ගේ සහෝදර සහෝදරියන් ;

(v) සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා ;

(vi) දෙමාපියන්ගේ සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා,

අදහස් වේ;

"වගඋත්තරකරු" යන්නෙන්, ආරක්ෂක ආඥාවක් හෝ අතුරු ආඥාවක් සම්බන්ධයෙන් වන විට, එම ආඥාව අපේක්ෂා කරනු ලබන්නේ හෝ කරනු ලබන්නේ යම් අදාළ තැනැත්තකුට එරෙහිව ද එම අදාළ තැනැත්තා අදහස් වේ.

I වන උපලේඛනය 22 වන වගන්තිය

1. දණ්ඩ නීති සංග්‍රහයේ XVI වන පරිච්ඡේදයේ අන්තර්ගත සියලු වැරදි.
2. දණ්ඩ නීති සංග්‍රහයේ බලෙන් ලබා ගැනීම. 372 වන වගන්තිය.
3. දණ්ඩ නීති සංග්‍රහයේ සාපරාධී බිය ගැන්වීම. 483 වන වගන්තිය.
4. ඉහත සඳහන් වැරදිවලින් යම් වරදක් සිදු කිරීමට තැත් කිරීම.

II වන උපලේඛනය 2 (3) වගන්තිය.

**ඉල්ලීම**

..........................මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

...................................................................පදිංචි ඒ. බී. (පීඩාවට පත් තැනැත්තාගේ නම, විස්තරය සහ ලිපිනය, සහ ඔහු යම් නියෝජන තත්වයකින් නඩු පවරන්නේ නම් ඒ තත්වය සඳහන් කරන්න. උදාහරණ අතෘප්තියට පත් තැනැත්තා ඔහුගේ භාරකරු හෝ සහාය මිතුරකු මගින් පෙනී සිටින බාලවයස්කරුවකු හෝ සිහිවිකල් තැනැත්තකු වන්නේ නම් මෙසේ කියන්න. "බාලවයස්කරු ඔහුගේ සහාය මිත්‍රයා වන..................හි සී. ඩී. මාර්ගයෙන්") (පීඩාවට පත් තැනැත්තා).

*එරෙහිව*

.......................................................වයි ඉසෙඩ් (අදාළ තැනැත්තාගේ නම, විස්තරය සහ ලිපිනය)................................................වන අදාළ තැනැත්තා 20..............මස..........දින දී ය.

(ස්වකීය ලියාපදිංචි නීතිඥ සී. එච්. මගින් පෙනී සිටින) ඉහත නම් සඳහන් පීඩාවට පත් තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ පැමිණිල්ලේ මෙසේ සඳහන් වේ :—

(මෙහි නඩුව පැවරීමට හේතු වන කරුණු සඳහන් කරන්න.)

එමනිසා 20......මස ............දින සිට බලපවත්වන පරිදි වගඋත්තරකරුට එරෙහිව ආරක්ෂක ආඥාවක් පනවන ලෙස පීඩාවට පත් තැනැත්තා (හෝ පීඩාවට පත් තැනැත්තන්) ගරු අධිකරණයෙන් අයැද සිටී.

..........................................

අත්සන

පීඩාවට පත් තැනැත්තා.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.